# රජයේ නිලධාරින්ගේ යහසාධක සංගමය

## ලේකම් හා ගණකාධිකාරි තනතුර

මෙම සංගමයේ ලේකම් හා ගණකාධිකාරි තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් හා අවශ්‍යතා සපුරා ඇති රාජ්‍ය සේවයේ ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සුදුසුකම් :
   රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ අධිපන්තියේ නිලධාරියකු හෝ I පන්තියේ නිලධාරියකු වීම.

2. අවශ්‍යතා :
   - 2.1 කොළඹට සැතපුම් 35ක් තුළ ස්ථිර පදිංචිය
   - 2.2 2018.11.26 දිනට වයස අවු. 55 ට නොවැඩිවීම
   - 2.3 රාජ්‍ය සේවයේ අවු. 15ට නොඅඩු සේවා කාලයක් තිබීම
   - 2.4 ගිණුම් හා පරිපාලන කටයුතු පිළිබඳ ප්‍රාමාණික දැනුමක්/හැකියාවක් තිබීම
   - 2.5 පරිගණක සාක්ෂරතාවය හා Internet and E-mail භාවිත හැකියාව
   - 2.6 ඉංග්‍රීසි භාෂාවෙන් හා සිංහල භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව
   - 2.7 අවම වසර 2ක ද්විතීයන පදනම යටතේ නිදහස් කිරීමට සේවා ප්‍රධානි/විනය බලධාරිගේ කැමැත්ත

3. වැටුප :
   - 3.1 අයදුම්කරු රාජ්‍ය සේවයේ නිත්‍ය තනතුර යටතේ ලබන මූලික වැටුප හා අනුමත සියලු දීමනා
   - 3.2 සංගමය විසින් ලබා දෙන (උපරිම රු. 21,000 කට යටත් වන) මූලික වැටුපෙන් 35% ක් වූ දීමනාව

4. රාජ්‍ය සේවයෙන් නිදහස් කිරීම (අංක 1589/30 2009 පෙබරවාරි මස 20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව)

4.1 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික (I කාණ්ඩයේ) රීති 142 සමග කියවිය යුතු 143 වන රීතිය අනුව - පරිශිෂ්ට අංක 10 ප්‍රකාර - නිලධාරියාගේ කැමැත්ත ප්‍රකාශිත ආකෘතිය සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාවය ද ලබාගෙන ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුය. (www.psc. gov.lk වෙබ් අඩවියෙන් ආකෘතිය බාගත කළ හැක.)

2018 නොවැම්බර් මස 26 වැනි දින මධ්‍යහ්න 12.00 ට පෙර ලැබෙනසේ ඔබ විසින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් (ඉහත 2.7 අනුව නිදහස් කළ හැකි බවට සහතික කර) පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. එම්. විජේරත්න,
*වැඩ බලන සභාපති.*

2018 ඔක්තෝබර් මස 26 වැනි දින,
රජයේ නිලධාරින්ගේ යහසාධක සංගමය,
අංක 65/1, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
දුරකථන අංක : 011-2434598, 2473633

10-1397